# මන්මුනයි දකුණු - එරුවිල්පත්තු ප්‍රාදේශිය සභාව

---------------------------------------------------------------

1. මූල්‍ය ප්‍රකාශ

------------------

1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම

--------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2014 අප්‍රේල් 09 දින ද, ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2013 මැයි 06 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 04 දින සභාවේ, සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි.

1.2 මතය

--------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශ වලින් 2013 දෙසැම්බර් 31 දිනට මන්මුනයි දකුණු - එරුවිල් පත්තු ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල වීම

--------------------------------------------------------

පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශ ලේකම්ගේ 2014 ජනවාරි 27 දිනැති පීඑල්/05/පීඒ/එස්එල්පීඑස්ඒඑස් දරන චක්‍රලේඛය අනුව රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ගෙවියයුතු රු. 16,000 ක්වූ විගණන ගාස්තු සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) NECORD ආයතනයෙන් ඉදිකර සභාව වෙත භාරදෙන ලද රු. මිලියන 10ක් වටිනා කාර්යාල ගොඩනැගිල්ල 2008 වර්ෂයේ සිට ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ඇ) අතැති තොග වල ඇතුලත් වු රු. 7,797 එකතු වටිනාකමින්වු පොදු ගබඩා භාන්ඩ සහ විදුලි උපකරණ 1989 වර්ෂයේ සිට ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ වශයෙන් හඳුනාගෙන තිබූ නමුත් එම භාණ්ඩ පොත්වලින් ලියාහැරීමට අවශ්‍ය කටයුතු නොකර වත්කම් වශයෙන් දිගටම පෙන්වා තිබුණි.

1.3.3 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) කළුවාන්චිකුඩි මහජන පොල සාප්පු සංකීර්ණයේ කඩ කාමර 19 ක බදු කරුවන් ගෙන් 1991 සිට 2003 වර්ෂය දක්වාවූ කාලපරිච්චේදයට අදාලව හිඟ බදු රු. 92,676 මුදල අයකර ගැනීමට හෝ පොත්වලින් ලියාහැරීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

(ආ) සභාවට අයත් මහජන පොලවල් 08 ක් වෙනුවෙන් 1985 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ රු. 3,110,486 ක හිඟ බදු අයකර ගැනීමට කටයුතු නොකර මූල්‍ය ප්‍රකාශ වල දිගටම පෙන්වා තිබුණි.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

-----------------------------------

මූල්‍ය ප්‍රකාශ වල දක්වා තිබූ පහත දැක්වෙන විෂයයන් ඉදිරියේ පෙන්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| විෂයය | වටිනාකම<br>රු | ඉදිරිපත් නොවු සාක්ෂි |
|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | 38,861,746 | හිමිකම් ඔප්පු |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 1,299,297 | ස්ථාවර වත්කම් ලේඛන සහ සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| ලි බඩු සහ සවිකිරීම් | 768,188 | |
| මෝටර් වාහන | 145,425 | |
| පුස්තකාල පොත් | 930,723 | |

1.3.5 නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකුල නොවීම

------------------------------------------------------

පහත සඳහන් අනුකුල නොවු අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1988 වර්ෂය ප්‍ර දේශිය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති | |
| (i) 1 පරිච්ඡේදයේ 5 (XII) වගන්තිය | මුදල්, ගබඩා ද්‍රව්‍ය සහ චෙක්පත්වලට අත්සන් තැබීම යනාදී කටයුතු නිලධාරීන් හතර දෙනෙකුට ක්‍රමානුකූලව භාරදී තිබුනද ඔවුන්ගෙන් ආරක්ෂක ඇප ලබා ගෙන නොතිබුණි. |
| (ii) III පරිච්ඡේදයේ 81 වගන්තිය | ඉඩම් වල අයිතිය පැවරීම සම්බන්ධව මුද්දර බදු ප්‍රතිපූර්ණ කිරීමේ අයදුම්පත් රෙජිස්ටාර් ජනරාල් වෙතද අනෙකුත් ගනුදෙනු සම්බන්ධ බදු ප්‍රතිපූර්ණය කිරීම සඳහාවූ අයදුම්පත් මහාභාණ්ඩාගාරයේ අධ්‍යක්ෂකවරයාටද දඩමුදල් ප්‍රතිපූර්ණ කිරීම සඳහාවූ අයදුම්පත් උසාවිවල ලේඛකාධිකාරි වෙතද එක් එක් කාර්තුව අවසානයෙදී ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) මුදල් රෙගුලාසි | |
| (i) මු.රෙ. 138 සහ 139(1) | වියදම් සහතික කිරීමේ නිලධාරි විසින් වියදම් සහතික කිරීමකින් තොරව රු. 106,296 ක ගෙවීම් කර තිබුණි |
| (ii) මු.රෙ. 755(1)(2) | භාණ්ඩ ලැබීම සටහන් (GRN) ලබා නොගෙන රු. 299,600 වටිනා කිරිපිටි සහ පෝෂණ ආහාර ද්‍රව්‍ය සභාව විසින් කලුවංචිකුඩි සෞඛ්‍ය වෛද්‍ය අධිකාරි කාර්යාලය වෙත ලබාදී තිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු.7,057,493 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු.2,522,785 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.4,534,708 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

2.2 ආදායම් කළමනාකරණය

----------------------------

2.2.1 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

----------------------------------------

සභාව විසින් ඉදිරිපත් කර තිබූ සමාලෝචිත වර්ෂයයේ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් අතර සැළකිය යුතු විචලනයන් නිරීක්ෂණය විය.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත ශේෂය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| වරිපනම් බදු | 420,000 | 35,700 | (384,300) |
| බදු | 10,890,000 | 8,207,191 | (2,682,808) |
| සේවා ගාස්තු | 712,500 | 356,432 | (356,068) |
| දඩ මුදල් | 5,552,000 | 6,700,408 | 1,148,408 |
| වෙනත් ආදායම් | 3,868,500 | 5,782,396 | 1,913,896 |

2.2.2 වරිපනම් හා බදු

-----------------

1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 134 වගන්තිය අනුව ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ තිබෙන ඉඩම් සහ ඉදිකරන ලද නිවාස, ගොඩනැගිලි සඳහා වරිපනම් බදු අයකර ගැනීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවෙන් වාර්ෂික වටිනාකම තක්සේරු කරවා ගැනීම සඳහා කටයුතු නොකිරීම නිසා දල වශයෙන් රු. 1,000,000 වාර්ෂික ආදායමක් අහිමිවී තිබුණි.

2.2.3 මුද්දර ගාස්තු

--------------

2013 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු මුද්දර ගාස්තු රු. 1,584,563 ක මුදල රෙජිස්ට්‍රාර් ජනරාල් වරයාගෙන් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

--------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

--------------------------------

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) වෙනත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු වලින් සභාවට භාරදී තිබූ මෝටර් වාහන 14 ක් සහ යන්ත්‍ර 04 ක අයිතිය සභාවේ නමට පවරා ගැනීම සඳහා අවුරුදු හයේ සිට නවය දක්වා කටයුතු කර නොතිබුණි.

(ආ) එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන යටතේ 2006 ජුලි 18 දින පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය අළුත්වැඩියා කර ප්‍රයොජනයට ගැනීමට කටයුතු නොකර ලබා ගත්දින සිට ගාල්කර තිබුණි.

(ඇ) සභාව විසින් විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් මාසිකව ගෙවා නොතිබූ හෙයින් 1995 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා දායක මුදල් රු. 1,598,551 ක් සභාව විසින් ගෙවියයුතුව තිබුණි.

(ඈ) 1987 වර්ෂයේ ප්‍රාදේශිය සභාව ආරම්භ කිරීමට ප්‍රථම නගර සභාව වශයෙන් ක්‍රියාත්මකවූ කාලයේ සිට විදුලි බල මණ්ඩලය වෙනුවෙන් විදුලිබලය මහජනයා වෙත ලබා දී තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සභාව විසින් මහජනතාව වෙත බෙදා හරින ලද විදුලිය වෙනුවෙන් විදුලි ගාස්තු හිගය රු. 1,656,328 ක ප්‍රමාණය අයකර ගැනීමට හෝ පොත්වලින් ලියාහැරීමට 1993 වර්ෂයේ සිට කටයුතු කර නොතිබුණි.

(ii) ලංකා විදුලිබල මණ්ඩලය වෙත ලබා දී තිබූ රු. 167,580 ක අත්තිකාරම් මුදල 1991 වර්ෂයේ සිට අයකර ගැනීමට හෝ පොත්වලින් ලියාහැරීමට කටයුතු කර නොතිබුණි.

(iii) සභාව විසින් ලංකා විදුලිබල මණ්ඩලයට ගෙවියයුතු රු. 2,069,410 ක හිග විදුලි ගාස්තුව ගෙවීමට 1991 වර්ෂයේ සිට කටයුතු කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ මැයි මස සිට දෙසැම්බර් මාස දක්වා වීදි පහන් වෙනුවෙන් විදුලි ගාස්තු වශයෙන් රු. 677,416 මුදලක් ලංකා විදුලි බල මණ්ඩලයට ගෙවියයුතුව තිබුණි.

3.2 හදුනාගත් පාඩු

----------------

සභාව සතු ධිවර බෝට්ටුව සහ යන්ත්‍රය සභාවේ සමාජිකයකුට 2009 වර්ෂයෙදී රු. 3,000 ක මාසික බදු මුදලකටද 2010 වර්ෂයෙදී රු. 2,500 ක මාසික බදු මුදලකට ද ලබා දී තිබුණි. කෙසේ වෙතත් ගිවිසුම් අවසන්වූ පසුවද බදුකරුවිසින් ධීවර බෝට්ටුව සහ යන්ත්‍රය සභාවට ආපසු භාර දී නොතිබුණි. මේ හේතුවෙන් සභාවට රු. 465,000 ක පාඩුවක් සිදුවී තිබුණි.

4 ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

-----------------------------------------

4.1 අයවැය පාලනය

------------------

අයවැයගත වියදම් සහ තථ්‍ය වියදම් අතර 24 % සිට 91 % දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛණය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

5 පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම් කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් කළමනාකරණය

(ඈ) ස්ථාවර වත්කම් පාලනය

(ඉ) සේවක ණය අයවීම්